# සරලා



දැහැමි නිමාෂා රත්නායක

සරලා

දැහැමි නිමාෂා රත්නායක

විශ්වෝදා ජාතික පාසල

කුරුණෑගල

කතෘගේ වෙනත් කෘති

★ චූට්ටිට හරි හිනා  (2023 රාජ්‍ය සාහිත්‍ය සම්මාන සඳහා නිර්දේශිත)

★ අපට අහිමි පොඩ්ඩිගේ ලෝකය

ISBN අංකය **978-624-206-672-1**

දැහැමි නිමාෂා රත්නායක

ඉහළගම

පිලැස්ස

071 8153006

# පෙරවදන

අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය  ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

2023 11 01

සරලා

"අනේ නෝනා කීයක් හරි දීලා යන්න......."

නරගරයේ වීදියේ එහෙමෙහෙ යන සෙනඟ අතර ඇවිදිමින් සරලා අසරණ ලෙස යන එන්නන්ට අත පෑවාය. බොහෝ දෙනෙක් ඒ හඬ නොඇසුණාක් මෙන් ගිය අතර ඇතමෙක් කාසි කිහිපයක් නොසැලකිල්ලෙන් සරලා දෙසට විසිකර යන්නට ගියෝය. තැන තැන විසිරුණු කාසි සරලා අහුලා ගත්තේ ආසාවෙනි.

තාත්තාගේ අතේ එල්ලී සිනාසෙමින් යන දැරියක දෙස ඇය නැවතී බලා සිටියාය. ඇය ඇඳ සිටි රෝස පාට මල් ගවුමට සරලාට ආශා සිතිණි.

සරලා මීට කලකට පෙර නගරයට ආවේ තාත්තා සමගිනි. පොළ ළඟ මාර ගස ඔවුන්ගේ නවාතැන විය. සරලාගේ තාත්තාගේ දෙනෙත අන්ධය. උදේ පටන් හවස් වන තුරුම ඔහු බටනලාව වාදනය කළ අතර එතනින් යනඑන අය ලබාදුන් මුදලක් එකතු කර ගත්තේ සරලාය ඔවුන් නිවසට ගියේ දෙනෙත අඳ අම්මාටද කෑමට යමක් රැගෙනය.

සරලාට දස විය සපිරෙද්දීම පියා රිය අනතුරකින් මිය ගියේය. එහෙත් ඈ සමඟ නගරයට එන්නට අම්මාට පුළුවන්කමක් නැත. ඒ ඇය අංශභාගය වැළඳීම නිසා එකතැන්ව සිටින නිසාය.

සරලාට බටනලාව වයන්නට පුළුවන්කමක් නැත. ඇය දැන් නගරය පුරා ඇවිද යන්නේ තමාටත් අම්මාටත් කන්නට යමක් සොයා ගන්නටය.

"අනේ මහත්තයා කීයක්හරි දීලා යන්න....."

"කාලකන්ණි... එනව මෙතන අතපාන්න.... මහ එවුන් ලේසියට පුංචි උන් එවනවා අනුකම්පාව ගන්න....."

සරලා තවත් ඉදිරියට ඇවිද ගියාය.

"අනේ සීයේ මට කීයක්වත් දෙන්න....."

"පලයන් යන්න."



"අනේ මැණිකෙ, පිං අයිති වෙයි මට කන්න මොනවහරි දෙන්න......

"ආ ඉදා මේක කාපන!"

ඒ මාළු බනිස් ගෙඩියකි. සරලා එය මල්ලට දමා ගත්තේ අම්මා සමඟ බෙදා ගන්නටය. බස් නැවතුමේ ජල නලය ඇයගේ කුසගිනි නිවන්නේය.

එතනින් ගිය කොළුරැළෙන් එකෙක් සරලාගේ කොණ්ඩයෙන් ඇද්දේය.

"හූ.....හූ......හූ...... "

අනික් අය එක රැළට සිනාසෙන්නට විය.

සරලාට ලැජ්ජා සිතිනි. ඇය එතනම සිමෙන්ති ගැට්ට උඩ ඉඳගෙන අත්දෙකින් මුහුණ වසා ගෙන අඬන්නට වූවාය.

අනේ.....! ඒත් සරලා සනසවන්නට කිසිවෙකු ඒ නගරයේ සිටියේ නැත .

සරලා බොහෝ වේලාවකට පසු එතනින් නැගිට්ටේ දැඩි අව්ව නිසාය. ඇය නිවසට යන්නට පෙර තව කීයක්වත් සොයා ගත යුතුය.

"අනේ මහත්තයෝ කන්න මොකුත්..."

ඇය කෑම කඩයකට රිංගා අයැද සිටියාය.

"පලයන්න යන්න..... බලපන් උඹේ ළඟ හඩුගඳ..... උඹ ඔතන හිටියාම කොහොමද කවුරුවත් ඇතුළට එන්නේ....?"

“අනේ මහත්තයෝ..... පිං අයිති වෙයි බඩගින්නට මොනවහරි.....”

“ඉඳා මේකෙන් සබන් කැල්ලක් අරන් පලයන් නාගන්න.....”

ඔහු රුපියල් පහේ කාසියක් සරලා දෙසට විසි කළාය. ඇය හනිහනිකට කාසිය අහුලා ගෙන එතනින් නික්මුණාය.

සරලාගේ දෙපා රිදුම් දෙන්නට විය. ඇය අඹ ගහ යට වූ බෝක්කු කැටය මත හිඳ ගත්තාය. ගසට හේත්තු වී දෙනෙත පියා ගත්තේ වෙහෙස නිසාය.

සරලාට නින්ද ගොස් තිබිණි. ඇය අවදි වන විට හවස් වී තිබිණි. සරලා මල්ලත් රැගෙන පාරට ආවේ තව ටික වේලාවකින් නිවසට යායුතු නිසාය. ගමට යන අන්තිම බසය වැරදුණොත් ඇයට රාත්‍රියද නගරයේ ගත කරන්නට සිදුවෙයි. එහෙත් බත් මුලක් ගන්නට මුදලක් ඇය අත තිබුණේ නැත. ඇය සෙමෙන් ඉදිරියට ඇදුණාය.

“වඩේ...... වඩේ...... වඩේ......”

ඇය ඒ හඬට සවන් දුන්නාය. කුඩා ළමයෙක් වඩේ විකුණයි. ඔහු නිමල්ය. කිහිප දෙනෙකුම ඔහුගෙන් වඩේ මිළදී ගනිමින් සිටියි. සරලා එතනට කිට්ටු වූයේ වඩේ කිහිපයක් මිළදී ගන්නටය. රැස්ව සිටි අය ඉවත්ව යන තුරු සිටි සරලා රුපියල් විස්සක් දිගුකර බලා සිටියාය.

“කීයක්ද?”

“කීයක්හරි.”

“ඔයාගෙ තාත්තා නේද ඉස්සර මාර ගහ ළඟ බටනලාව පිම්බේ?”

“ඔව්.”

“ඇයි දැන් තාත්තා එන්නෙ නැත්තේ?”

“තාත්තා මැරුණා....!”

“ඒ මොනව වෙලාද?”

“හැප්පිලා.”

සරලාගේ දෙනෙතෙන් කඳුළු වැටෙන්නට විය.

“ආ මෙන්න.”

ඔහු වඩේ හත අටක් කවරයකට දමා සරලා දෙසට දිගු කළේය.

“මෙච්චර? රුපියල් විස්සකට?”

“සල්ලි එපා.”

ඔහුගේ එක අතක් වකුටුය. කකුල් දෙක බකලය. එකතැනක සිට වඩේ විකුණන්නේ ඒ නිසා විය යුතුය. සරලාට දෙනෙත් අදහාගත නොහැකිය. දෙකන් අදහාගත නොහැකිය.

සරලා කිසිවක් නොකියා වඩේ මල්ලත් රුපියල් විස්සත් රැගෙන දිව ගියේ බස් රථය පාරට ගත් නිසාය.

ඒ රාත්‍රිය බොහෝ දිගු විය. සරලා කල්පනා කළේ නිමල් ගැනය. ඔහු කොතරම් උත්සාසවන්තද? ඔහුටද සිගමන් යදින්නට තිබිණි. ඔහුට කිසිවෙකු තමාට මෙන් නින්දා අපහාස නොකරනු ඇත. පහසුවෙන්ම මුදලක් ඉල්ලා ගන්නට ඔහුට හැකිය. එහෙත් ඔහු තමාගේ මහන්සියෙන් මුදලක් උපයා ගනී. සරලාට ලැජ්ජා සිතිණි.

“ඇයි මටත් බැරි නිමල් වගේ මොනවහරි කරලා ජීවත් වෙන්න”

සරලාට සිතිණි ඇය බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියේ තමා ජීවත් වීම උදෙසා කුමක් කළ යුතුද යන්න පිළිබඳවය.

වෙනදා මෙන් එදා උදේ බස් රථයෙන් සරලා නගරයට ගියේ නැත . ඇය ඒ වෙනුවට කූඩයත් රැගෙන ලන්දට වැදුණේ පළතුරු ටිකක් සොයා ගන්නටය. වෙරළු ගහ ගෙඩිවලින් බරවී තිබිණි. පේරත් ඇඹුල්පේරත් එකතු කර ගන්නට සරලාට හැකිවිය.

“අදට මේ ඇති” සරලා කූඩයත් රැගෙන හනිහනිකට නගරයට ගියාය. ඇය බස් නැවතුම අසලම කූඩය දිගහැර වෙරළු විකුණන්නට වූවාය. හදිසියෙන් මෙන් එහෙමෙහෙ දිවයන සෙනග කිසිවෙකු ඇය දෙස බැලුවේවත් නැත . එක පුංචි නංගි කෙනෙක් අම්මාගේ අතින් අදිමින් වෙරළු ඉල්ලා අඬන්නට විය.

“කීයද වෙරළු?”

“කීයක්හරි දෙන්න.”

සරලා වෙරළු ගෙඩි දහයක් කැන්ද කොළයක ඔතා දැරියට දුන්නාය. ඇගේ මව ඇයට රුපියල් විස්සක් දී යන්නට ගියාය.

"උඹ මොකද ඔතන කරන්නේ?"

ඒ රළු හඬින් සරලා තිගැස්සී ගියාය.

"පලයන් යන්න....."

පළතුරු කඩේ මාමා අත උස්සාගෙන ඇය දෙසට එමින් සිටියේය.

"ඉතින් පලයන්......."

සරලා පළතුරු කූඩයත් රැගෙන පස්ස නොබලා දුවන්නට විය. ඇය නතර වුණේ අඹ ගහ යට බෝක්කු කැටේ ළඟය. මද වේලාවක් හති හලමින් සිටි සරලා කූඩය ඇරගෙන ඒවා විකුණන්නට විය.

"මෙහෙම ඉඳලා බෑ..... මමත් යන එන අයට කතා කරලා මේ ටික විකුණා ගන්න ඕනෑ..."

"වෙරළු..... වෙරළු.... ඇඹුල්පේර.... එන්න නෝනා.... ඇවිත් බලන්නකෝ...."

සරලාගේ පළතුරු කූඩය හිස්වන්නට වැඩි වේලාවක් ගතවූයේ නැත . වෙනදාට වඩා මුදලක්ද එකතු වී තිබිණි.

සරලා කඩයකට වැදී අම්මාටත් තමන්ටත් බත් පාර්සලයක්ද රස කැවිලි කීපයක්ද මිළ දී ගත්තාය. ඊළඟට ඇය කූඩය පතුළේ සඟවාගෙන සිටි ඉදුණු ඇඹුල්පේර මල්ල රැගෙන ගියේ නිමල් වඩේ විකුණන තැනටය.

“මේක අයියට.....”

“මොනවද?”

“ඇඹුල්පේර.”

“කොහෙන්ද?”

“ මම දැන් පළතුරු  විකුණනවා  මේ..............”

සරලා මුදල් දමා සිටි පොලිතින් බෑගය එළියට ගෙන පෙන්නුවාය.

“ආ.....”

“සල්ලි එපා අයියට ගොඩක් පින්.....”

නිමල් කිසිවක් කියන්නට පෙර සරලා ආපසු හැරී දිව ගියේ බස් රථය පාරට ගත් නිසාය.



පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කරගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් මුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධාපනයේ දිශාන්තිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 11 01